**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120
ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk

මගේ අංකය / எனது இலக்கம் / My NO — 390/2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024
දිනය / திக / Date — 05/03/2024 පැය 1840

# මාධ්‍ය නිවේදනය

**මනුෂ්‍ය ඝාතනයකට තැත් කිරීමේ අපරාධයකට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අයිස් මත්ද්‍රව්‍ය සමඟ අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.02.25 වන දින වෙරළබඩ පොලිස් වසමේ නිව්හැම් චතුරශ්‍රයේ පිහිටි වෙළඳසැලක් ඉදිරිපිටදී යතුරුපැදියකින් පැමිණි පුද්ගලයන් දෙදෙනෙකු විසින් වෙඩි තබා ඝාතනය කිරීමට තැත් කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාසයේ සංවිධානාත්මක අපරාධ විමර්ශන ඒකකයේ නිලධාරීන් විසින් විමර්ශන සිදුකර, මෙම වෙඩි තැබීමට ආධාර අනුබල දුන් සැකකරුවෙකු 2024.03.04 වන දින සවස් කාලයේදී වැල්ලම්පිටිය පොලිස් වසමේ සිංහපුර ප්‍රදේශයේදී **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 04 මිලිග්‍රෑම් 100 ක්** ද සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන මහවත්ත පාර, කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අපරාධය සිදුකිරීම සඳහා යොදා ගත් ගිනි අවිය අපරාධය සිදුකිරීමට පෙර මෙම සැකකරුගේ නිවසේ තබාගෙන ඇති බවට අනාවරණය වී ඇති අතර, සැකකරුගේ නිවසේ සඟවා තිබී විදේශ රටක නිෂ්පාදිත පිස්තෝල වර්ගයේ ගිනි අවියක්, මැගසින් 01ක්, සජීව පතරොම් 03 ක් හා යතුරු පැදියක් සොයාගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු 2024.03.05 වන අද දින අලුත්කඩේ අංක 02 ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව දින 07 ක රැඳවුම් නියෝග ලබා ගෙන ඇත. කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**